# ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික ගෘහ කලා (කුඹල් කර්මාන්තය)

එස්.එම්.එන්.ආර්. ලක්මාලි[65]

---

බඩල්කුඹුර නගරයේ සිට බුත්තල මාර්ගයේ කි. මී 5 ක් ගමන් කළපසු පුන්සිසිගම හංදියෙන් වම්පෙදෙසට හැරී කි.මී 5 ක් පමණ ගමන් කළපසුමෙමමඩුගහපට්ටිය ග්‍රාමයේ පිහිටි පී.ධර්මදාස මහතාගේ කුඹල්නිෂ්පාදනආයතනයපිහිටා තිබේ. බඩල්කුඹුරප්‍රාදේශියලේකම්කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවසම් 41 කින්වසම් 03 ක පමණ මෙම කුඹල් කර්මාන්තය ව්‍යාප්තව තිබේ. පවුල් 05 ක් මෙමවසම් 03 ට විසිරිමෙයපවත්වාගෙනයනු ලබයි. දැනටඅවුරුදු 30 කටපමණපෙරසිටමොවුන්මෙම කර්මාන්තය වර්තමානය තෙක්ඉදිරියට රැගෙනවිත් තිබේ. මොවුන්ට තම දෙමාපියන්හාමුතුන්මිත්තන්ගෙන් ලැබූ ආභාසයහේතු වී ඇත. මෙමපවුලේඅතීතයේදි, පවුලේප්‍රධානියා වන. ධර්මදාස මහතාපමණක්මෙම කාර්යය කරගෙනආනමුත් දැනට තම බිරිඳ හාදරුවන්ගේ ද සහයෝගයඇතිවඔවුන්ගේශ්‍රමය ලබාමෙයපවත්වාගෙනයනු ලැබේ. මෙම කාර්යය සදහාඅවශ්‍යමුලිකසම්පත්වනමැටිඅතීතයේ දි මෙමප්‍රදේශයෙන්මසොයාගෙනඇතත්වත්මන්හිමැටි ක්‍ෂය වීමත් සමග ඉතාදුෂ්කරතාමැදමැණික් ගඟ දෙපසටගොස් ඒ අවට කුඹුරුවලින් ලබා ගනී.මැටිභාණ්ඩ තැනීමසදහාඅවශ්‍යඋපකරණලෙස දියබදුන, සකපෝරුව, ඇඹරුම්කටුව, නුල්කැබලි, රෙදිකැබැල්ල, දර, පදම්කරගත් මැටි, පෝරණුව, උණ පතුරු යනාදියයොදා ගනී. මැටිභාණ්ඩසැකසිමේපියවරලෙස මැටිහදුනාගැනීම, මැටිපදම් කිරිම, මැටි මැදි කිරිම, මැටි පිළියෙල කිරිම, මැදසොයා ගැනිම, බදුන සකපෝරුවෙන් ඉවත්කිරිම,මදපවනේ වියලිම, බදුනට පතුලක් සැකසීම, සැරසිලි එක් කිරිම, බදුන පුළුස්සා ගැනීම, වෙලදපොලට ගෙන යාම,වැනි ක්‍රියා පිළිවෙලින් සිදුකරනු ලබයි. එයින්නිමවෙනභාණ්ඩලෙස ගෘහඋපකරණ, කලාත්මක භාණ්ඩ හා ගොඩනැගිලි සෙවිලිකිරිමසදහා ද උපකරණ නිර්මාණය කරනු ලැබේ.

ප්‍රමුඛ පදඃ මැටි පදම් කිරීම,මැටි පෝරණුව,උණ පතුරු

---

[65]සමාජීයවිද්‍යා හා මානවශාස්ත්‍ර පියය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, Shani.siriwardhana40@gmail.com.